ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2480/11 - 2026 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2026.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

III වැනි කොටස - ඉඩම්

ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : බිය 3/1/3/02/2017-(ii).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සියඹලාපෙ ගමේ පිහිටි මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 512439හි කලාප අංක 02හි පත්‍ර අංක 01 සහ 2026.02.17 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කෙරෙන ප්‍රමාණය හෙක්ටයාර් 0.3035 (අක්. 0 රූඩ් 03 පර්. 0) ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. කැබලි අංක 01

ඉඩමේ නම: දෙල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 50-60 පමණ වයසැති පොල් ගස් 20, අවුරුදු 25-30 පමණ වයසැති කොස් ගස් 09, අවුරුදු 10-15 පමණ වයසැති කොස් ගස් 11, අවුරුදු 10-15 පමණ වයසැති දෙල් ගස් 01, අවුරුදු 10-15 පමණ වයසැති අඹ ගස් 01 සහ අවුරුදු 25 - 30 පමණ වයසැති කැලෑ දෙල් ගස් 01ක් ඇත.); හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.3035 (අක්. 0 රූඩ් 03 පර්.0).

ඉහත සඳහන් ඉඩමට පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන්හිදී පහත සඳහන් වේලාවට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

දිනය	කැබලි අංකය	වේලාව
2026.04.20	01	පෙ. ව. 10.00

තවද, 2026 අප්‍රේල් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

වන්දන උඩවත්ත
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2026 මාර්තු මස 16 වැනි දින,
සපුගස්කන්ද, මාකොළ,
බිගයම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0155